සුදු හංසිනී.....

මව් බිමේ සිට මා තරංග අතරින් දුරකථනයෙන් ඇසෙන්නේ ඇයගේ මධුර කටහඬයි. හැඟීම් බර ගායනයයි. අර්ථවත් පද රචනාවන්ගෙන් හා ගැලපී ගත් මියුරු තනු හා සංගීත රටාවන්ගෙන් ප්‍රභාමත්ව දිදුලන සුනිල විල්තලයක ගායනයෙන් තරග නංවමින් පිහිනන්නීය. මේ සුදු හංසනිය නිසග කුසලතාවන් නිරන්තර අධ්‍යපනයෙන් හා සතත අභ්‍යාසයෙන් වඩවාලමින් විටෙක ජනප්‍රියත්වයෙන් හිණිපෙත්තටම නැගුණාය. ඈ විටෙක අර්ථ / හා රසපූර්ණ ගායනය වෙනුවෙන් සම්මානයෙන් පිදුම් ලැබුවාය ඈ. ඇය දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරියයි. සංගීතාචාර්‍යවරියයි. ප්‍රවීණ ගායන ශිල්පිනියයි. රසික දනන්ගේ දයාදර යෙහෙළියයි.

"හොඳ ද සිසර සින්දුව ?" තැටි වාදන යන්ත්‍රයෙන් සිය දුරකථනය මෑත් කරමින් මව්බිමේ සිට සිනා නැගුවාය ඇය.

"මං මේ වචන ටික ලියාගන්නයි දැගලුවේ. පංකාදුයි කව්ද ලිව්වේ ? කියලා නේද ලියව ගත්තේ ?" අපගේ උනන්දුව පිළිබඳව දිපිකාද උනන්දු වන්නා සේය.

"ඉන්න මම වචන ටික කියන්නම් හරියට ලියාගන්න සුනිල් අයියයි ලිව්වේ "දීපිකා සුනිල් අයියා" නමින් හදුන්වන්නේ සුනිල් ආර්.ගමගේ ප්‍රවීණ ගී පද නිබන්ධකවරයායි.

"සංගීතය, තනුව රෝහණ අයියාගේ," ඇය රෝහණ වීරසිංහයන්ව හදුන්වන්නේ එනමින් අවුරුදු හතකට පස්සේ මම මගේම නිෂ්පාදනයක් විදියට සින්දු දහසයක් ඇතුලත් සංගීත තැටියක් එළිදක්වන්නයි සූදනම් වෙන්නේ." "ගී සදළුව" වෙනුවෙන් සටහන් තැබීමට වටිනා සුභාරංචියක් නොවේද මේ".

"පසුගිය කාලේ අපේ හිතේ තිබුනේ යුද්ධය ගැනනේ. කලාව ගැන අපට තිබුනේ කඩා වැටුන හිතක්. අඳුරු කාලයක්. ඉතින් ඒ අඳුරට ශාප කරනවාට වැඩිය පහන් සිළක් හරි පත්තුකරන්න උත්සාහ කරන එකනේ අපේ වගකීම. ඉතින් මම හෙමින් හෙමින් වියහියදම් තියෙන තියෙන හැටියට මුතු ඇට පෙළක් වගේ ගීත ටිකක් කළා. "
"මගේ හිතට මුලටම ආපු සිතුවිල්ල තමයි රෝහණ අයියා. මං කුඩා කාලයේ මේ ගෙදරට ම ඇවිත් අපට අවස්ථාව ලබාදුන්න ඒක ගැන මට තියෙන්නේ ලොකු ගෞරවයක්. ඒ වගේම කෘතවේදී බවක්. ඉතින් ඒ කෘතවේදී බව දක්වන්න තියෙන හොඳම විදිය විදියට රෝහණ අයියාගේම සංගිත නිර්මාණ 16ක් කරන්න හිතුවා. මුලින්ම "ආපු තපර ලායිලා" සින්දුව කරපු දවසේ ඉදලා අද වෙනකොට රෝහණ අයියලා දිග ගමනක් ඇවිත් තියෙනවා. ඒ ගමනේ අත්දැකීම් එක්ක ඒ කරන නිර්මාණවල සුන්දරත්වය අද ඇය අදුනනවාද, වැඩක් ගන්නවාද කියන එක ප්‍රශ්නයක් "

"අනික මට රෝහණ අයියා දුන්න ආලෝකය මගේ ගමනට හරි වැදගත් වුණා. ඒ නිර්මාණ ගැන මට හොඳ ඉවක්

# සුදු හංසිනී

තියෙනවා වගේම, රෝහණ අයියාටත් මගේ ගායනය ගැන හොද අවබෝධයක් තියෙනවා. ඒ නිසාම ඒ ගීත සාර්ථක වෙනවා. ඉතින් ඔය කාරණ නිසාම මේ ගීත එකතුව පිළිගන්වන්නේත් රෝහණ අයියාටමයි."

"සංගීත සංයෝජනයෙන් සුරේෂ් මාලියද්දේ සහයෝගය දුන්නා. සුරේෂ්ගේ ෆේම් :ඊපැ* (ශබ්දාගාරයේදීයි අලුත් පහසුකම් යොදාගෙන මේ පටිගත කිරීම් කලේ. සුරේෂ්

ප්‍රේමය නමින්
නුඹ වගේ මං
වින්ද දුක් අනන්තයි
සුදු හන්සිනී......

විල් දියතරම්
ඇස කඳුලු ගැළුවා
කල් බැලු සිත සෙනෙහසම පැතුවා
හිත එකළසක් කරගන්න බැරිද
මට ප්‍රේමයද සරදමක් වුවා .....

රන් එළි වැටක
සිත පහන් දල්වා
මං මුළාකර කරුවලෙහි ගිල්වා
සිත පෙම්හසින් අසරණම වුද
මට මා ගැනම නොසිතුණෝ මොනවා ?

**ගී පද - සුනිල් ආර්.ගමගේ**

හොද කනක් තියෙන , සංගීතය ගැන හොද අවබෝධයක් තියෙන තරුණ සංගීතවේදියෙ-ක්."




"ගීත රචනයට මම මේ වතාවේ තෝරා ගත්තේ මට මුලින්ම අත්වැල දුන්න ප්‍රවීණ රචකයින් පස් දෙනෙකුව. මුලදි සල්ලි බලාගෙන නෙවෙයිනේ අපට හොද දේවල් දුන්නේ. ඒ අයත් තමන්ගේ ජීවිතයේත්, කලා ජීවිතයේත් දිගු ගමනක් ඇවිත්. ඉතින් ඒ අයට දක්වන කෘතවේදීකමක් විදියට මහාචාර්ය සුනිල් ආරියරත්න, කුමාරදාස සපුතන්ත්‍රී, කුලරත්න ආරියවංශ, සුනිල් ආර් ගමගේ, බන්ධුල නානායක්කාරවසම් කියන ප්‍රවීණයිනගේ ගී පද රචනා එකතු කර ගත්තා"



"සංගීතයට රෝහණ අයියාව තෝරා ගත්තාට, මගේ ගීතවලට දයකත්වය දුන්න හැම සංගීතවේදියෙක්ම මම සිහිපත් කරන්නේ කෘතවේදීව. ඒ වගේමයි සෑම ගීත රචකයෙක්ම ආදරයෙන් මේ වේලාවේ සිහිපත් කරනවා"

"ඉතින් ඒ අය හැමෝම නියෝජනය වෙන විදියට ඒ ඒ අයගේ නිර්මාණ ඇතුලත් කරලා "සුදු හංසිනී" කියලා පොතකුත් එළිදැක්වෙනවා ගී එකතුවක් එක්කම. සැප්තැම්බර් 18 වෙනිද කොළඹ බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී මේ දෙරට වැඩුම කරන්නේ. ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයත් ඒ දවස්වලට යෙදිලා තියෙන නිසා කාටත් නොමිලේම සහභාගීවෙන්න ඉඩකඩ වැඩි වැඩියෙන් ලැබෙනවා. ඉතින් ඒ කාලයේදී මේ සුභ කටයුත්තට සහභාගී වෙන්න පුලුවන් හැමෝටම අපි ඉතාම ආදරයෙන් ආරාධනා කරනවා සැපැම්ණෙන්නටය කියලා. "

"සුදු හංසිනි" සංගීත තැටිය සමගින් එම නමින්ම එළි දැක්වෙන ග්‍රන්ථය දීපිකා ප්‍රියදර්ශනීගේ "සෞන්දර්ය ශාලිකාවේ" ප්‍රකාශනයක්. එය සංස්කරණය බුද්ධදාස ගලප්පත්ති පියාණන්ගේයි. සිසිර විජේතුංග විජය බණ්ඩාර, සරත් පෙරේරා, නාරද අමරතුංග යන සහෘදයෝ ඊට නන් අයුරින් දායක වෙති. ඒ සියලු දෙනාට අමතරව සැම නිරන්තරයෙන්ම තමන්ට සහයෝගය ලබාදුන්න දයානන්ද පෙරේරා, මර්වින් බෙන්ස් ශබ්ද පාරිපාලකවරුන්ටත් සියලු වාද්‍ය ශිල්පීන්ටත් ඇයගේ කෘතවේදී බව පල කරන්නීය, දීපිකා.

"පසුගිය කාලේ හුග දෙනෙක් මේ නිර්මාණ කටයුතු වලින් බැහැර වෙලයි ඉදලා තිබුනේ. ඒ අයවත් අවදි කරවාගෙන එයාලා වෙනුවෙන්ම බලා ඉදලා මේ ගීත එකතුව කලේ පවිත්‍ර චේතනාවකින්. සමහර විට එක ගීතයක් කරන්න අවුරුද්දක් විතර ගියා. අපි කවදාවත් කෙනෙකුගේ හිත රිදවන දෙයක් කරලා නෑ. ආදරය, කරුණාව වාගේ සංකල්ප තියෙන මේ ගීත එකතුව පුරාවටම ආදරය දැනෙනවා. ඉතින් ඔය වෙනුවෙන්

නුඹ වගේ මං වින්ද දුක් අනන්තයි
"සුදු හංසියේ !"

සිය මියුරු හඬින් මුමුණමින් අපහට සමුදුන්නාය. දීපිකා ප්‍රියදර්ශනීය. පාඨක ඔබ වෙනුවෙන් සුභ පැතුවෙමු, අපි ඇයට.




අඥානය, තමන්ගේම කර පිටින්
ගමන් යා හැකිද කිසිවකුට...?
යදියකුව ඔබ යදින්නේත් ඔය
දොරටුව අසලයි ඔබේම කුටියේ..(

දෙන්න ඔබේ දුක් කඳුළු
ගමන් පැස මේ දෑතට
දැරිය හැකි සියළු බර
පා නගන ඔබ සමග
නොබලන්න කනස්සල්ලෙන්
හැරී ආපසු මනස්තාපයෙන්

ආශාවේ උණුසුම් සුසුම
සිප වැළඳ නිවාලයි
ජීවනයේ ගිතෙල් පහනේ
දැල්වෙනා ගිනි සිළුව

නොපතන්න නොලබන්න
කිසිදිනක කිසිත් කිසිවක්
රැඳුනු තැවරුනු මොහොතකටවත්
ආශාවේ අපිරිසිදු දෑත් වල

දිගු කරන්න ඔබේ දෝත
පිරවෙන්න මේ උදාසන
දයාබර සෙනෙහසින්
සුසුදු ආදරයෙන් පිදෙන
පිණි බිඳෙන් වත දෙවුනු
සුවඳ සිගිති සුදෝ සුදු මල් අහුරු...(

O Fool" try to carry thyself upon thy own shoulders` O beggar" to come beg at thy own door`

Leave all thy burdens on his hands who can bear all" and never look behind in regret'

Thy desire at once puts out the light from the lamp it touches with its breath' It is unholy take not thy gifts through its unclean hands' Accept only what is offered by sacred love'

*රබින්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු